මහජන අත්වැලට අගනා ප්‍රතිචාරයක්

නැගෙනහිර පළාතේ කල්මුණේ සහ අprevious ආදායම්වේනයි ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ හවුල්වද අප ආයතනය සංවිධානය කළ මහජන අත්වැල ප්‍රදර්ශන හා මහජන මණ්ඩපයන්ට ප්‍රදේශවාසීන්ගෙන් ඉමහත් ප්‍රතිචාරයක් ලැබුණි.

යහපාලනය සහ දූෂණය වැළැක්වීම පිළිබඳව කරුණු පහදදීම සඳහා අප විසින් පවත්වන ලද ප්‍රදර්ශනයට සම්භාවිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ජනතාව අතර අනෝන්‍ය සහයෝගිතාවය වැඩිදියුණු කිරීම හරහා ප්‍රාදේශීය පරිපාලනයේ කාර්යක්ෂමතාවය ශක්තිමත්කිරීම මෙහි අරමුණ විය.

පුද්ගලයින් ලියාපදිංචිකිරීමේ දෙපාර්තමේන්තුව, ආගමික සහ විගමන දෙපාර්තමේන්තුව, විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ලද සංගම කාර්යාල වලින් විශාල සේවයක් ඉටුකරුණි.

දූෂණ හා අසාධාරණවලට එරෙහිවන්නන්ට නීති පිහිට

දූෂණ හා අකුමිකතාවලට එරෙහිව ක්‍රියාත්මකවන්නන් හා දූෂණ හිතා අසාධාරණවලට ලක්වූවන් උදෙසා නීති පිහිට ලබාදෙන මධ්‍යස්ථානයක් (ALAC) ඇරඹීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය කටයුතු කරමින් සිටී.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ප්‍රධාන කාර්යාලය ආශ්‍රිතව පිහිටුවන මෙම මධ්‍යස්ථානය හරහා දූෂණ හා අකුමිකතාවලට එරෙහිව හඬ නගන්නන්ට, දූෂණ හා අකුමිකතා පිළිබඳව තොරතුරු කිරීමට, සාක්ෂි සපයමින් උත්සාහ දරණ පුද්ගලයින්ට ස්වාධීන හා රහස්‍යභාවය ආරක්‍ෂාවන පරිදි නීති උපදෙස් සහ පිහිට ලබාදීමට පියවර ගැනෙනු ඇත.

දැනටමත් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය සමග සම්බන්ධ රටවල් 50 කට අධික සංඛ්‍යාවක මෙවැනි මධ්‍යස්ථාන සාර්ථකව ක්‍රියාත්මක වේ.

ආසියා පැසිෆික් කලාපයේ පාකිස්ථානය, ජී.ජී, නේපාලය පසුපවා හිටිගිනි, සොලමන් දූපත සහ වනුආටු යන රටවල මෙවැනි මධ්‍යස්ථාන පිහිටුවා තිබේ.

ඕනෑම පුද්ගලයෙකුට මෙම මධ්‍යස්ථානය හරහා නොමිලයේ තොරතුරු ලබාගත හැකි වන අතර දූෂණය වැඩිවශයෙන් සිදුවන ස්ථාන හඳුනා ගැනීම සහ එම තත්වය වෙනස් කිරීමට හඬක් නැගීම, රජය සහ සිවිල් සේවා සංවිධාන සමග එක්ව වැඩකිරීම පිළිබඳව රහස්‍යභාවය සුරැකෙන පරිදි නීති උපදෙස් ලබා ගත හැකිය.

දූෂණවලට එරෙහිවීම හා අසාධාරණයන්ට ලක්වූවන් උදෙසා නීති පිහිට මධ්‍යස්ථාන පිළිබඳ වැඩිදුර තොරතුරු දැනගැනීමට පහත ලිපිනය හෝ දුරකථන අංක මගින් සම්බන්ධ වීය හැකිය.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
ආයතනය අංක 6, 37 වැනි පටුමග, කොළඹ 03.
දුරකථන- 0114369781 ෆැක්ස්- 0112506419
ඊමේල්- tisl@tisrilanka.org.

ඉඩම් ගැටලු පිළිබඳ වැඩමුළුවක්

ඉඩම් හා සම්බන්ධ ගැටලු වලට විසඳුම් ලබාදීමේ හැකියාව පිළිබඳව රාජ්‍ය නිලධාරීන් දැනුම්වන් කිරීමේ වැඩමුළුවක් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය යුරෝපා සංගමයේ අනුග්‍රහය ඇතිව පසුගියදා පැවැත්විය.

තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුබද්ධ නිලධාරීන් දැනුම්වත් කිරීම සඳහා පැවති මෙම වැඩමුළුවට ග්‍රාම නිලධාරීන්, ඉඩම් නිලධාරීන් ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 50 කට වැඩි පිරිසක් එක් වූහ.

තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේදී පැවති මෙම වැඩමුළුවට හිටපු ඉඩම් කොමසාරිස් කීර්ති ගමගේ සහ උතුරු මැද පළාතේ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් ඊ.එම්.එම් ඊකනායක යන මහත්වරුන් පුහුණුකරුවන් ලෙස සහභාගී වූහ.

මෙහිදී ඉඩම් හා ඉඩම් පනතට අදාළ කරුණු සංවාදයට ලක්වූ අතර ඊට අදාළව ඉදිරිපත් වන පොදු ගැටලු 50 ක් ඉඩම් නිලධාරීන් විසින් මෙහිදී පදනාගනු ලැබූහ. එම ගැටලු පුමාදයකින් තොරව විසඳාලීමට ගනයුතු පියවර පිළිබඳව මෙහිදී රාජ්‍ය නිලධාරීන්ට උපදෙස් ලබාදෙනු ලැබීය.

ජාතික සුපිළිපන් ප්‍රණාම සඳහා නාමයෝජනා 62 ක්

ලබන දෙසැම්බර් 09 වනදා පැවැත්වෙන ජාතික සුපිළිපන් සම්මාන උළෙල සඳහා නාමයෝජනා 62 ක් ලැබී ඇත. එලෙස ලැබී ඇති නාමයෝජනා කෙටි ලැයිස්තු ගත කිරීම මේ දිනවල සිදුවෙමින් පවතී.

ස්වාධීන විනිසුරු මඩුල්ලක් විසින් නාමයෝජනා අතරින් තෝරාගනු ලබන ජයග්‍රාහකයන්ට දෙසැම්බර් 09 වනදා එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී දින කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වෙන උත්සවයේදී සම්මාන ප්‍රිතාගමනය කරනු ඇත.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් මෙම සම්මාන උළෙල පවත්වනු ලබන්නේ 08 වන වරටය. එහි ප්‍රධාන ආරාධකයා ලෙස ජාතසන්තරව පිළිගත් තාහාපතිවරයෙකු වන ජයන්ත ධනපාල මහතා සහභාගී වීමට හියමිතය.

මෙම වසරේදී නාමයෝජනා බහුතරයක් බස්නාහිර පළාතෙන් ලැබී තිබූ අතර, ඉතිරි නාමයෝජනා අතරින් සියයට 29 ක ප්‍රතිශතයක් නැගෙනහිර පළාතෙන් ලැබී තිබිණි. පසුගිය වසරේදී නැගෙනහිර පළාතේ තිකුණාමලයෙන් ඉදිරිපත් වූ නාමයෝජනාවක් පූර්යේ විශේෂ ඇගයීමට ලක්වීය.

මෙහි තවත් විශේෂත්වයක් වනුයේ ලැබී තිබූ නාමයෝජනා අතරින් සියයට 36 ක් රාජ්‍ය අංශයෙන් ඉදිරිපත්ව තිබීමය. පසුගිය වසරාවනුවේදී ඉතා ඉහළ තනතුරු දැරූ රාජ්‍ය අංශ නිලධාරීන්ට සම්මාන හිමිවීය.

සෑම වසරකදීම ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය, දූෂණය මැඩැලීමට සහ යහපාලනය ස්ථාපිත කිරීමට හිතබ හා ධෛර්යයිමත් මෙහෙවරක සෙදෙන පුද්ගලයන් හා සංවිධාන ඇගයීම් සඳහා මෙම සම්මාන උළෙල පවත්වනු ලැබේ.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා,
අංක 6, 37 වෙනි පටුමග,
කොළඹ 03.

දුරකථන : 011 4 369 781
ෆැක්ස් : 011 2 506 419
ඊ මේල් : tisl@tisrilanka.org

වැඩිදුර විස්තර සඳහා අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න
www.tisrilanka.org

සුපිළිපන්

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
සුපිළිපන් දේශයන් හොඩකමලු

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා - පුවත් හසුන 2011 ඔක්තෝබර්

'දූෂණයෙන් තොර රටක් වෙනුවෙන් කැපවෙමු' ප්‍රතිඥාවට තම අනුමැතිය ලබාදීම සඳහා කල්මුණේ හා අprevious ආදායම්වේනයි ප්‍රදේශවාසීන් විශාල උනන්දුවක් දැක්වූහ. ඊට අත්සන් තැබීමට එක්වූ පිරිසක් ඡායාරූපයේ දැක්වේ.

කල්මුණේ සුනාමි දූෂණ සෙවීමට ඒකාබද්ධ විමර්ශනයක්

කල්මුණේ ප්‍රදේශයේ සුනාමි බේදවාචකයෙන් පසු හානියට පත්වූවන් වෙනුවෙන් නිවාස ලබාදීමේදී හා නිවාස ඉදිකිරීමේදී සිදුවී ඇතැයි කියන වංචා පිළිබඳව සොයාබැලීම සඳහා ඒකාබද්ධ පියවරක් ගැනීමට කල්මුණේදී පැවැත්වුණු මහජන මණ්ඩපයේදී තීරණය විය.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ඉකුත් ඔක්තෝබර් 20 වැනි දින කල්මුණේදී පැවැත්වූ මහජන මණ්ඩපයේදී ඇතිකර ගත් මෙම තීරණයට අනුව අල්ලස් හෝ දූෂණ වෝදනා විමර්ශන කොමිෂන් සභාව (CIABOC) කල්මුණේ (දෙමල) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ මහජනතාව සමග එක්ව මෙම ඒකාබද්ධ ප්‍රයත්නය ක්‍රියාත්මක කරන අතර ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය ඊට සහාය වනු ඇත.

කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (දෙමල) සමග එක්ව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය කල්මුණේ ක්‍රිස්ටා ලූර්හම් ශාලාවේදී සංවිධානය කළ මෙම මහජන මණ්ඩපයට ප්‍රදේශවාසීන් විශාල පිරිසක් එක්ව සිටියහ. එහිදී ජනතාවගෙන් ඉදිරිපත් වූ ප්‍රශ්නවලට පිළිතුරු දීමට ප්‍රාදේශීය ලේකම් කේ. ලවනදන් මහතා ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් හා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරීන්ද එක්ව සිටියහ.

මෙම මහජන මණ්ඩපයේදී ප්‍රශ්න ඉදිරිපත් කළ කල්මුණේ ප්‍රදේශවාසීන් සුනාමි අනාථයන් වෙනුවෙන් ඉදිකළ නිවාස බොහෝමයක් ලබා දී ඇත්තේ දේපාලඥයන්ගේ සහ ඊවීඩ නිලධාරීන්ගේ හිතවතුන්ට බවට චෝදනා නැගූහ. සුනාමියට ගොදුරුවූවන් හිසට වහලක් නොමැතිව පුන් පිදිදීමේ වෙරලාසන්නයේ හෝ ජීවන් නොවූ පුද්ගලයන් හිවාස අයිති කරගෙන සිටින බව ඔවුහු පෙන්වා දුන්හ. ඇතැම් පුද්ගලයින්ට නිවාස දමකට වැඩි ගණනක් හිමිව තිබෙන බවද ඔවුහු කියා සිටියහ. මෙම චෝදනා බොහෝමයක් සත්‍ය බව සඳහන් කළ ප්‍රාදේශීය ලේකම්වරයා මෙම ප්‍රශ්න විසඳීමට හිලධාරීන් මෙන්ම ඇතැම් දේශපාලඥ නායකයන්ද ඊවීඩ උත්සාහයන් හනු ලැබුවද එම උත්සාහයන් ව්‍යර්ථ වූ බව පැවසූහ. "කල්මුණේ එක්තරා ඉඩමක පුද්ගලික හිවාස 1000ක් ඉදිකර තිබෙනවා. කිසිවෙකුටත් ඒ ඉඩමට යන්නවත් අවසරයක් නැහැ. අපි දිසාපතිතුමා සමග ඉතා දැඩි උත්සාහයක් ගන්නවා. එම හිවාස සාධාරණව ජනතාවට ලබාදෙන්න" ලවනදන් මහතා කීය.

සුනාමි අනාථයන්ට ලබාදුන් නිවාස සම්භරක් එසා දමා තිබෙන බව පැවසූ ගෙනෙත් ඊට සේතුව ඒවායේ හිමිකරුවන් දුරස්ථයෙර ප්‍රදේශවල පදිංචිව සිටීම බව සඳහන් කළේය.

මෙම සංවාදයෙන් අනතුරුව මහජන මණ්ඩපයට එක්ව සිටි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ නියෝජිතයින් මෙම චෝදනා සහ වංචා සොයා බැලීමට ඒකාබද්ධ ප්‍රයත්නයක් ක්‍රියාත්මක කළ යුතු යැයි යෝජනා කළ අතර ඊට මුළු සහාවේම අනුමැතිය පළ විය.

ආචාර්ය සුමංසිරි ලියනගේ

අද පවත්නා පළාත් පාලන ක්‍රමය මුළුමනින්ම වෙනස්විය යුතුයි

"අද පළාත් පාලන ඡන්දයත් දේශපාලන පක්ෂ අනුව සටන් කරන, අතිවිශාල මුදල් සම්භාරයක් වැයකරන මැතිවරණයක් බවට පත් වී තිබෙනවා. වර්තමානයේ ඡන්දය කියන්නේ බීස්නස් එකක්."

''ලංකාවේ පළාත් පාලන ආයතන වලට ඉතාම වැදගත් ඉතිහාසයක් තිබුණා. 1977 ට පෙර පැවති ගමීසභා ක්‍රමය යටතේ ගමීසභාවට පත් වුණේ ගමේ සිටින වෙන්දේසිය කායකයෝයි. ඒ මිනිස්සු එදා ජන්දය ඉල්ලුවෙ බයිසිකලයෙන් ගිහින්. කම්වැසියෝ ඔවුන් අල්ලපුවේ "අයියා" . . "මාමා" නමින්.

''ප්‍රාදේශීය පරිපාලනයේ ඇත්ත වෙනසක් ඇති කිරීමටනම් අපි හැවෙන 1970 ගණන්වලට පෙර පැවති වැසස්ථා සම්පදායේ මූලධර්ම මත පදනම් වූ අලුත් ව්‍යවස්ථාවක් සකස් කළ යුතුයි.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශයේ සහාය මහාචාර්ය ආචාර්ය සුමංසිරි ලියනගේ මහතා මෙම අදහස් පළ කළේ සැප්තැම්බර් 29 වැනිදා කොළඹ මහජන පුස්තකාල ශ්‍රවනාගාරයේදී පැවති ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා "සම්භාෂණ " මහජන සංවාද මණ්ඩපයට සහභාගි වෙමිනි. කොළඹ විශේෂ විද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ප්‍රධානි ආචාර්ය රිසුඩර් පීරිසිංහ මහතා සහ සමාජ ක්‍රියාකාරිනී ශාන්තනි සච්චිතානන්ද මහත්මියද මෙම සංවාද මණ්ඩපයට සහභාගි වූහ. සංවාදය මෙහෙයවනු ලැබුවේ හිතිඳු ජගත් ලියනාරච්චි මහතා විසිනි. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ සභාපති එම්.ඩී.ඒ හැරල්ඩ් මහතා "සම්භාෂණ " සංවාද මණ්ඩපයේ අරම්භක පැහැදිලි කරමින් පැමිණ සිටි පිරිස පිළිගනු ලැබීය.

තමා අදහස් පළ කරන්නේ අද දේශපාලන කතිකාව තුළ පවත්නා "ආධිපත්‍ය ප්‍රවේශය" නැතහොත් යහපාලන රාමුවට පරිපාතිවව බව සඳහන් කරමින් අදහස් දැක්වූ ආචාර්ය ලියනගේ මහතා සඳහන් කළේ 1978 වසස්ථාව මගින් හඳුන්වා දෙන ලද නව ව්‍යුහයන් හා ඡන්ද ක්‍රමය වෙනස් නොකොට හොඳ ලිබරල් සමාජයක් ඇති කිරීම කළ නොහැක්කක් බවයි.

1977 න් පසුව අපේ දේශපාලන ක්‍රමයේ ප්‍රධාන වෙනස්කම් දෙකක් සිදුවුණා. ඒ දෙකම එකිනෙකට සම්බන්ධයි. එනම් ජන්ද ක්‍රමය හා එම ක්‍රමය යටතේ මැතිවරණ වෙනුවෙන් තරග කිරීමට අතිවිශාල මුදල් සම්භාරයක් අවශ්‍ය වීමයි. මේ සමඟම තමයි ජන්දය බිස්නස් එකක් බවට පත්වීම සිදුවන්නේ. නොදම උදාහරණය තමයි මම ඊවී එකෙන් දැක්කා, එක අපේක්ෂකයෙක් කියනවා පසෙක හායකයෙකුට උදාහරණ රුපියල් මිලියන 500 ක් එක් ජන්දයකට ඊට පස්සෙ ජන්දෙට දුන්නලු රුපියල් මිලියන 1000 ක්. මම ඒත් හිතුවා මේ කියන්නේ ලක්ෂද කියලා. නැහැ. ඒ මිලියන. මම අහන්න කැමතියි මේ රෙට් ආදායම් බදු දෙපාර්තමේන්තුව කියා ද මේ මහුන්ස්‍ය ප්‍රසුට මේ සල්ලි කොහෙන්ද ආවේ කියලා අහන්න. සොයලා බැලුවිද මේ මිලියන ගාණ වියදම් කළේ කොහොමද කියලා. කවුරුවත් මේ ප්‍රශ්නය අහන්නේ නැහැ.

පැරැල්ල සංවිධානය විසින් සඳහන් කර තිබුණා එක් දිනකදී කොළඹ නගර සභාවට එක් අපේක්ෂකයෙක් විසින් ලක්ෂ 10 ක් ජන්දය සඳහා දුවසකට වියදම් කරන බව. දවස් 30 සඳහා ලක්ෂ 300යි. මේ වියදිමට වියදම් නොකර ජන්ද දීමනම බැහැ. ඒ නිසා කවුරුසෑර් කියනවා නම් මෙම ව්‍යුහයන්, මෙම ව්‍යවස්ථාව සහ ජන්ද ක්‍රමය වෙනස් නොකර, දේශපාලන පක්ෂ ක්‍රමය වෙනස් නොකර, මේ රටේ හොඳ ලිබරල් සමාජයක් ඇති කරන්න පුළුවන් කියලා එය ඉතාම බරපතල වැරැද්දක්.

රිදීමාලියද්ද සභාපතිගෙන් පැසසුම්

රිදීමාලියද්ද ප්‍රදේශයේ ජනතාව රාජ්‍ය නොවන සංවිධාන ඇතුලු සංවිධානයන්ට වෙර කරමින් සිටි නමුත් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය පැමිණ එම තත්වය වෙනස් කළ බව රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ සභාපති කරු. ඊරරත්න මහතා පැවසීය.

"අතීත එක්ක වැඩ කරන්න ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) එනවා කිව්වහම අපිට විශ්වාසයක් තිබුණේ නැහැ. නමුත් මේ වැඩමුළුවෙ එක පැයක් ඉන්නකොට අපිට හේරුණා අපට කොච්චර දේවල් ඉගෙන ගන්න තියෙනවද කියලා" ඊරරත්න මහතා කීවේය. තමන් සභාපතිධුරයට පත් වන විට සභාවේ ගිණුම් හිස්ව පැවති බවත් ඒ අනුව ඉදිරි සංවර්ධන කටයුතු සිදුකළ යුත්තේ කෙසේදැයි තල්පනා කරමින් සිටි බවත් පැවසූ සභාපතිවරයා වැඩමුළුවේ තුළදී ලබාගත් දැනුම නිසාම අවම ප්‍රාග්ධනයක් යටතේ සංවර්ධන කටයුතු මෙහෙයවන්නේ කෙසේදැයි අවබෝධ කර ගත් බවද සඳහන් කළේය.

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා මේ අදහස් පළ කළේ එම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් සඳහා පැවති තෙදින වැඩමුළුවට අවසානයේදීය. එම වැඩමුළුවට පක්ෂ වීපක්ෂ සියලුම මන්ත්‍රීවරුන් සහභාගී වූහ. පක්ෂර සැලකිසහගැන්න පුහුණු මධ්‍යස්ථානයේදී පැවති මෙම වැඩමුළුවේදී දූෂණය යනු කුමක්ද, දූෂණය අවම කිරීමට ගත යුතු පියවර, යහපාලනය, පළාත් පාලන ඉතිහාසය, පළාත් පාලන පනත, මූල්‍ය වීධි විධාන සහ ශ්‍රී ලංකාවේ පරිපාලන අත්දැකීම් පිළිබඳව පුහුණුවීම් සිදුකරන ලදී.

මෙයට අමතරව ප්‍රාදේශීය පරිපාලනයේ මහජන දායකත්වය පිළිබඳවද මෙහිදී උපදෙස් ලබාදෙන ලදී

සබරගමුව පළාතේ හිටපු ප්‍රධාන ලේකම් පියතිස්ස රණසිංහ, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අතීත රත්නායක සහ කේ. ජයසුන්දර යන මහත්වරුන් සහ හිටපු නියෝජ්‍ය වීගණකාධිපති සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ සභාපති එම් ඩී. හැරල්ඩ් මහතා පුහුණුකරුවන් ලෙස මෙම වැඩමුළුවටට එක් වූහ. වැඩමුළුවට සම්බන්ධීකරණය සිදුවනු ලැබුවේ නොමිලේ විමලරත්න විසිනි.

පුහුණුවෙන් පසු පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් එක්ව සිටි අවුරුදු සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයෙන් දළ සැලසුමක උපකාර ඉල්ලා සිටියහ. රිදීමාලියද්ද ප්‍රාදේශීය පරිපාලනය පවත්වාගෙන යායුතු ආකාරය එම සැලැස්මට එක් වන අතර එය වැඩිදුරටත් සකස් කර සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

වත්කම් බැරකම් නීතිය බලාත්මක කිරීමට සියලු දෙනා පෙළගැසිය යුතුයි - විද්වත්හු ඉල්ලා සිටිති

දූෂණයට එරෙහිව ශ්‍රී ලංකාවේ පවත්නා බලවත්ම නීතියක් ලෙස සැලකිය හැකි වත්කම් බැරකම් නීතිය වඩාත් වගීකරන් හා බලාත්මක කිරීම සඳහා සියලුම පාර්ශවයන් ඒකාබද්ධ විය යුතු යැයි විද්වත්හු පෙන්වා දෙති.

වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේදී කරුණු සැඟවීම, කරුණු වීකෘති කිරීම වැනි අවස්ථාවන්හිදී වලංග ක්‍රියාකරන පුද්ගලයන්ට දඬුවම් කිරීමට හැකිවන පරිදි මෙන්ම ප්‍රකාශයට පත්කරනු ලබන වත්කම් බැරකම් ජනතාව හමුවේ ප්‍රසිද්ධ කළ හැකිවන පරිදි නීති බලාත්මක විය යුතු යැයි ඔවුහු පෙන්වා දෙති.

මෙම කරුණු පෙන්වාදෙනු ලැබුවේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ සංවිධානත්වයෙන් පසුගියදා කොළඹ ජේ. ආර් ජයවර්ධන කේන්ද්‍රයේදී 'වත්කම් බැරකම් හා දේපාලනය' යන තේමාව යටතේ පැවති සම්භාෂණ මහජන මණ්ඩපයට සහභාගි වෙමිනි. මෙම සංවාද මණ්ඩපය සඳහා මැතිවරණ කොමසාරිස් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ජෙෂෝඨ නිලධාරී පිරිසක්ද සහභාගි වූහ.

කැළණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ මහාචාර්ය කේ. කරුණාතිලක, බස්නාහිර පළාත් අමාත්‍ය උදය ගම්මන්පිල, රාවය ප්‍රවෘත්තයේ ප්‍රධාන කර්තෘ වික්ටර් අයිවන් සහ ජෙෂ්ඨ නීතිඥ ජාවිඩ් යුසුෆ් යන මහත්වරු ප්‍රධාන කථිකයින් ලෙස සහභාගී වූ මෙම සංවාදය මෙහෙයවනු ලැබුවේ පැත්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා විසිනි.

'ශ්‍රී ලංකාවේ බලවත්ම නීතියක්'

එහිදී අදහස් දැක්වූ රාවය ප්‍රවෘත්තයේ කර්තෘ වික්ටර් අයිවන් මහතා දූෂණ විෂයයට අදාළව ශ්‍රී ලංකාවේ තිබෙන බලවත්ම නීතියක් ලෙසින් වත්කම් බැරකම් නීතිය හැඳින්විය හැකි බව පෙන්වා දුන්නේය. විශේෂ තවත් ආකාරයේ මෙම නීතිය දේශපාලන තලයේ පමණක් නොව දූෂණ විරෝධී ව්‍යාපාරවල පවා අඩුම සැළකිල්ලක් ලැබුණු නීතිය ලෙසින් හැඳින්විය හැකියැයි ද හෙතෙම පැවසීය.

ජනාධිපතිවරයාත් එක් අවස්ථාවකදී වත්කම් බැරකම් නීතියට යටත් වෙනු ලැබේ. එනම් පළමුවර ජනාධිපතිධුරයට තේරීපත් වී දෙවෙනි ධුර කාලය සඳහා හැවිත තරග කරන විට මෙම නීතිය යටතේ ජනාධිපතිවරයා ඔහුගේ වත්කම් බැරකම් ප්‍රකාශයට පත්කළ යුතු වේ.

වත්කම් බැරකම් නීතිය යටතේ බලය පවතින්නේ කෙනෙකු වත්කම් බැරකම් ප්‍රකාශයට පත්කිරීම මත පමණක් නොව මහජනතාව හෝ වෙනත් විවිධ කණ්ඩායම් විසින් එම වත්කම් බැරකම් ප්‍රකාශයන්හේ පිටපත් ඉල්ලා පරීක්ෂා කළහොත් පමණක් යැයිද අයිවන් මහතා සඳහන් කළේය.

තොරතුරු ලබාදීමේ අයිතිය ඉතාම බලවත් ආකාරයකින් ලබා දී තිබෙන එකම නීතිය ලෙසිනුත් මෙම වත්කම් බැරකම් නීතිය හැඳින්විය හැකිය.

වත්කම් බැරකම් ප්‍රකාශයට පත් කිරීම පමණක් නොව එකී ප්‍රකාශවලදී කරුණු සැගවීම, කරුණු වීකෘති කිරීම නීතිවිරෝධී වරදක්ද එම වත්කම් බැරකම් නීතියේ විශේෂත්වයකි.

වත්කම් බැරකම් නීතිය සංශෝධනය වන්නට පෙර බලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදීම ඉතිහාසේ කරන්නේනම් මහජනයාට උසාවියට ගොස් බලධාරීන්ට එරෙහිව පැමිණිලි කිරීමේ අවස්ථාව හිමි වුවත් විරහමාසයේ එකී බලය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව යටතට පත්කර තිබෙන බවද අයිවන් මහතා පෙන්වා දුන්නේය.

පුළුල් කථිකාවතක් ඇතිවිය යුතුයි

තමන් සිතන ආකාරයට වත්කම් බැරකම් නීතිය පිළිබඳ පුළුල් සමාජ කතිකාවතක් ඇතිවිය යුතුයැයි පළාත් සභා අමාත්‍ය උදය ගම්මන්පිල මහතා පැවසුවේය.

'2009 පළාත් සභා මැතිවරණයෙදී බස්නාහිර පළාත් සභාවට තරග වදිද්දි මම හිතුවා අපි දේපාලනයෙදී විවේචන කරමින් ඉන්නවිට වඩා යම් ආදර්ශයක් දිය යුතු බව. ඒ අනුව මම පක්ෂෙට යම් ප්‍රතිඥාවන් කිහිපයක් ඉදිරිපත් කරා ඉන් එක් ප්‍රතිඥාවක් වූණේ වාර්ෂිකව මගේ වත්කම් බැරකම් ප්‍රකාශය ඉදිරිපත් කරන බව ඒ අනුව මම වත්කම් බැරකම් ප්‍රකාශය ඉදිරිපත් කර තිබි ජයාපිටපත් මාධ්‍යවේදීන් අතර බෙදා දුන්නා. එමෙන කළේ වත්කම් බැරකම් පිළිබඳ අදහස සමාජගත කිරීමේ අරමුණින්. ඇස්තරමම ඒ දිනවල ඒ සම්බන්ධව හොඳ කතිකාවතක් ඇතිවුණා' ගම්මන්පිල මහතා කීවේය.

වත්කම් බැරකම් ප්‍රකාශ භාරදුන් පමණින් දේශපාලකයින් අහිසි ලෙස මුදල් ඉපයීම හැරවන්වීය හැකිද යන්න අවධානය යොමුකළ යුතු යැයි ද වත්කම් බැරකම් නීතියේ ප්‍රබල අඩුපාඩු පවතින බවද හෙතෙම සඳහන් කළේය. ' එකක් තමයි මේ නීතිය ක්‍රියාත්මක වෙන්නෙ දණ්ඩනයට ඇති බිය නිසා ඒ නිසා දණ්ඩනය හරියට ක්‍රියාත්මක නොවන විට නීතිය සමාජයේ ක්‍රියාත්මක වන්නෙ නෑ. දැනට තිබෙන නීතිය අනුව කෙනෙක් වත්කම් බැරකම් ප්‍රකාශ භාර නොදුන්නොත් රුපියල් 1,000 ක් හෝ වසරකට හොඅඩු සිර දඬුවමක් ලැබීමට හැකිවයි. නමුත් පසුගිය වසර 36 පුරාවට වත්කම් බැරකම් ප්‍රකාශ භාර නොදීමේ වරදින් හිඟං ගිය අයවත් දැඩි මුල ගෙවූ අයවත් මා දන්නා තරමින් කවුරුවවත් නැහැ. ඒ නිසා නීතියේ දඩුවම ක්‍රියාත්මක නොවන විට ඒ නීතිය සමාජයේ ක්‍රියාත්මක වන්නේ නෑ'

'නීති ශක්තිමත් කරමින් ඉදිරියට යා යුතුයි.'

අපේ රටේ වත්කම් බැරකම් වැනි නීතීන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීම පිළිබඳ විමර්ශනය කිරීමට තරම් හිති ශක්තිමත් නොවැනි බවත් ඒ නිසා නීති ශක්තිමත් කරගනිමින් ඉදිරියට යාමට රටට අවශ්‍ය බවත් සංවාදයට එක්වූ මහාචාර්ය කේ. කරුණාතිලක මහතා පැවසුවේය. ජනතාවට තොරතුරු ලබාගැනීමේ අයිතියක් පවතින බව හා වගකිව යුතු නිලධාරීන් තොරතුරු ප්‍රකාශ කිරීමට බැඳී සිටින බව සම්බන්ධයෙන් ජනතාව දැනුවත්ව සිටිය යුතු බවද ඒ මහතා පැවසීය.

'නිලධාරියෙක් හැරියට තමන්ගෙ